# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2252/32 - 2021 නොවැම්බර් මස 03 වැනි බදාදා - 2021.11.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතුයැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2021 ඔක්තෝබර් මස 25 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහළ,
"සුහුරුපාය" සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

1A - G 35269 — 25 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## කලවාන නාගරික බල ප්‍රදේශය

*I වැනි තීරුව*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටියා වූ අංක 195, කුකුලේගම උතුර, අංක 197 බී, කොස්වත්ත, අංක 196 සී තපස්වරකන්ද, අංක 196 කලවාන බටහිර, අංක 196 ඊ, කලවාන නැගෙනහිර හා අංක 197 සී වෙම්බියගොඩ යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට අයත් වන්නා වූ කලවාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි II වැනි තීරුවේ විස්තර වන ඉම් සලකුණු සහ මායිම්වලින් සමන්විත වූ මුළු මහත් භූමි ප්‍රදේශය.

*II වැනි තීරුව*

**උතුර :**

අයගම - කලවාන මාර්ගයේ මධ්‍ය රේඛාව කුකුලේගම උතුර ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඡේදනය කරන ලක්ෂ්‍යයෙන් ආරම්භ වී එකී මායිම ඔස්සේ නැගෙනහිර දෙසට කොලොන්න ඇලේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට කොලොන්න ඇලේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොණ දෙසට පැගිරිමාන්හේන්යාය ඇලේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එකී ඇලේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොණ දෙසට තපස්වරකන්ද ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම ඔස්සේ ඊසාන දෙසට කලවාන බටහිර ග්‍රාම නිලධාරී වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ බටහිර, උතුරු හා නැගෙනහිර මායිම් ඔස්සේ ඊසාන, නැගෙනහිර, ගිනිකොණ දෙසට කලවාන නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ උතුරු හා නැගෙනහිර මායිම් ඔස්සේ නැගෙනහිර හා දකුණු දෙසට කලවාන - රත්නපුර ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද,

**නැගෙනහිර :**

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කලවාන නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට වෙම්බියගොඩ ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය තෙක් ද එතැන් සිට එකී ග්‍රාම නිලධාරී වසමේ උතුරු හා නැගෙනහිර මායිම් ඔස්සේ දකුණු දෙසට කොස්වත්ත ගඟේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද,

**දකුණ :**

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කොස්වත්ත ගඟේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර, දෙසට කලවාන - වැද්දාගල ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය තෙක් ද, එතැන් සිට කොස්වත්ත ගඟේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දෙසට කුකුලේ ගඟේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද,

**බටහිර :**

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කුකුලේ ගඟේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දෙසට කලවාන - මතුගම ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එකී ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන දෙසට කුකුලේගම - අයගම මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය තෙක් ද, එතැන් සිට එකී මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දෙසට ආරම්භක ලක්ෂ්‍ය හමුවන තෙක් ද වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.